# MANAGEMENT ACCOUNTING & FINANCE (MAF)

302









ගිණුම්කරණය

මූල්‍ය ගිණුම්කරණය

කළමනාකරණ ගිණුම්කරණය

# ගිණුම්කරණයේ ප්‍රභේද

ගිණුම්කරණ තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශවයන් සහ සපයන තොරතුරු වල ස්වභාවය අනුව ගිණුම්කරණය කොටස් 2කින් යුක්තවේ.

**ගිණුම්කරණය**

**මූල්‍ය ගිණුම්කරණය (Financial Accounting)**

ගිණුම්කරණ ඒකකයක අතීත ගනුදෙනු හා සිද්ධීන් වලට අදාළ තොරතුරු ආර්ථිකමය තීරණ ගැනීමට සුදුසු වන ආකාරයට සකස් කර අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් වෙත ඉදිරිපත් කිරීම මූල්‍ය ගිණුම්කරණයයි.




**කළමනාකරණ ගිණුම්කරණය (Management Accounting)**

ආයතනයක සියළුම කළමනාකරණ මට්ටම් වලට අවශ්‍ය වන පරිදි සැලසුම් කිරීම, පාලනය කිරීම තීරණ ගැනීමට අදාළ වන තොරතුරු සකස්කර ඉදිරිපත් කිරීම කළමනාකරණ ගිණුම්කරණයයි.





# කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය



# කළමණාකරණ ගිණුම්කරණය හැදින්වීම

**කළමණාකරණ ගිණුම්කරණය යනු,**

- ව්‍යාපාරයක අරමුණු ඉටු කර ගැනීම සදහා ප්‍රතිපත්ති සම්පාදනය, ආයතනික කටයුතු සැලසුම් කිරීම, විකල්ප අතරින් තීරණ ගැනීම,තීරණ බාහිර පාර්ශවයන්ට අනාවරණය කිරීම, ආයතනයේ වත්කම් ආරක්ෂා කිරීම යන අවශ්‍යතා සපුරාලීම සදහා තොරතුරු කළමණාකරණය වෙත සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය කළමණාකරණ ගිණුම්කරණය වේ.

## ඒ සඳහා ඵලදායී ලෙස,



- දිගුකාලීන සැලසුම් ස්ථාපිත කිරීම.
- කෙටිකාලීන සැලසුම් ස්ථාපිත කිරීම. (අයවැයකරණය/ ලාභ සැලසුම් කිරීම.)
- සත්‍ය ගනුදෙනු වාර්තා කිරීම.
- මූල්‍ය පාලනය
- ක්‍රම සහ මෙහෙයුම් සමාලෝචනය හා වාර්තා කිරීම.

සිදු කළ යුතුය.

# මූල්‍ය ගිණුම්කරණය හා කළමණාකරණ ගිණුම්කරණය අතර වෙනස

| මූල්‍ය ගිණුම්කරණය | කළමණාකරණ ගිණුම්කරණය |
| --- | --- |
| • ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයකි | • ව්‍යවස්ථාපිත අවශ්‍යතාවක් නොවේ. |
| • මූල්‍ය වාර්තා අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ට ලබා දේ. | • කළමණාකරණ වාර්තා අභ්‍යන්ත පාර්ශවන්ට පමණක් ලබා දේ.. |
| • මුදලින් මැනිය හැකි ගනුදෙනු හා සිදුවීම් පමණක් අදාළ කර ගනී | • මුදලින් මැනිය නොහැකි වුවද තීරණ ගැනීම සඳහා වැදගත් වන තොරතුරු අදාළ කර ගනී. |
| • අවසාන මූල්‍ය ප්‍රකාශන සංෂිප්තව ඉදිරිපත් කෙරේ. | • ඉතා සවිස්තරාත්මකව තොරතුරු අවශ්‍ය පාර්ශවවලට ඉදිරිපත් කෙරේ. |
| • ගතවූ ගිණුම් කාලපරිච්ඡේදය තුළ සිදු වූ ගනුදෙනු පිළිබදව පමණක් අවදනය යොමු කෙරේ. | • වඩාත් අවදනය යොමුකරනුයේ අනාගත කටයුතු සැළසුම් කිරීම සදහාය. |




මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් පහත නිර්ණායක ඔස්සේ දක්වන්න

| නිර්ණායක | මූල්‍ය ගිණුම්කරණය | කළමනාකරණ ගිණුම්කරණය |
|---|---|---|
| 1.තොරතුරු භාවිතා කරන පාර්ශව | | |
| 2.තොරතුරු වල ස්වභාවය | | |
| 3.තොරතුරු වාර්තා කරන වාර ගණන | | |
| 4.තොරතුරු වාර්තා කරන කාලය | | |
| 5.වාර්තා කරන ඒකකය | | |
| 6.ගිණුම්කරණ සංකල්ප ප්‍රමිත නීති රීති වලට අනුකූල වීම | | |
| 7.නෛතික අවශ්‍යතාවය | | |
| 8.මූල්‍ය වාර්තා වල ආකෘතිය | | |
| 9.විගණන අවශ්‍යතාවය | | |



# කළමණාකරණ ගිණුම්කරණයේ වැදගත්කම

- ව්‍යාපාරයක මූල්‍ය කාර්යයන් හා අනෙකුත් කාර්යයන් අතර මනා සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට උපයෝගී වීම.
- අදාළ පිරිවැයකරණ විශ්ලේෂණයන් තුළින් වර්තමාන තත්වයන් ඇගයීම් කර අනාගතයේදී කටයුතු කළ යුතු ආකාරය පිලිබදව යෝජනා ලබා දීම.
- තීරණ ගැනීමට සියලුම තාරාතිරම් වල කළමණාකරනයට අවශ්‍ය තොරතුරු ලබා දීම.
- ව්‍යාපාරික මෙහෙයුම් ක්‍රම පාලනය කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම.
- මූල්‍ය දත්තයන් සහ තොරතුරු අවබෝධ කර ගනිමින් ඉරිදි කටයුතුවලට අවශ්‍ය තීරණ ගැනීමට හා එම තොරතුරු සම්පිණ්ඩන කර දීම.
- ව්‍යාපාරයක ප්‍රශ්ණගත කාර්යයන් / අංශයන් හදුනා ගැනීමට සහ උපායමාර්ගික තීරණ ගැනීමට උපකාර වීම.

# පිරිවැය හා සම්බන්ධ සංකල්ප (CONCEPTS RELATION TO COSTING)

## පිරිවැය - Cost



- යම් භාණ්ඩයක් හෝ සේවාවක් සදහා දරන ලද වියදම්වල එකතුවත්, ඒ සදහා ආරෝපණය කළ හැකි වියදම්වල එකතුවත් පිරිවැය ලෙස හදුන්වයි.




- උදා-: ලී බඩු නිෂ්පාදන ආයතනයක අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරන දැවවල වටිනාකම , වඩු කාර්මික වැටුප ආදී සුජු වියදම්වල පමණක් නොව , එම ආයතනයේ වරිපනම් ,කුලී යන වියදම්වලින් කොටසක් ලීබඩු පිරිවයට ඇතුළත් වීම.

# පිරිවැය ඒකකය - COST OF UNIT

## "What is your charge?”

- පිරිවැය ගණනය කිරීම සහ හදුනා ගැනීම සදහා භාවිත කෙරෙන කුඩාම ප්‍රමාණාත්මක මිනුම් දණ්ඩ පිරිවැය ඒකකයක් ලෙස හදුන්වයි

| කර්මාන්තය | පිරිවැය ඒකකය |
| --- | --- |
| මෝටර් රථ | නිෂ්පාදිත කාර් ගණන |
| ඇගලුම් කම්හල | නිෂ්පාදිත ඇගලුම් අයිතම |
| වැලි | කියුබ් |
| පාසල | ලියාපදිංචි සිසුන් |







# පිරිවැය මධ්‍යස්ථානය

පිරිවැය ඒකක අතර පිරිවැය පසුව බෙදාහැරීම සදහා පිරිවැය එක් රැ කරන අතර මැදි ස්ථානය, පිරිවැය මධ්‍යස්ථානය ලෙස හැදින් වේ. මෙම පිරිවැය මධ්‍යස්ථානය, ස්ථානයක්, පුද්ගලයෙකු, උපකරණයක් හෝ මේවායින් කිහිපයක එකතු වක් විය හැකිය.

ඇතැම් ස්ථානවලදී පිරිවැ ඒකකයම පිරිවැය මධ්‍යස්ථානය විය හැකිය. එහෙත් ආයතනයක් විවිධ දෙපාර්තමෙන්තුවලට හා අනු අංශවලට බෙදු ඇති විට එම දෙපාර්තමෙන්තු හා අනු අංශ එක්එක් පිරිවැය මධ්‍යස්ථාන ලෙස සැලකේ.

උදා-
නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන - ඇගලුම් කම්හලක කැපීමේ අංශය
සේවා පිරිවැය මධ්‍යස්ථාන - ඇගලුම් කම්හලක නඩත්තු අංශය

# SUMMARY




OLIVIA
WILSON

# Thank you

